රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 03/2019

මගේ අංකය: EST-4/02/REM/0198-01
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ හා
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2019.10.28

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## විශ්‍රාමික රජයේ නිලධරයන් නැවත සේවයේ යෙදවීම

විශ්‍රාමික නිලධරයන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමේ දී අදාළ වන විධිවිධාන ඇතුළත් 2018.02.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛයේ විධිවිධාන පරිදි විශ්‍රාමික රජයේ නිලධරයෙකු කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවන්නේ නම් ඒ පිළිබඳව පහත සඳහන් විස්තර නිලධරයා සේවයේ යොදවා මාසයක් ඉකුත්වීමට පෙර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු ය.

I. නැවත සේවයේ යෙද වූ විශ්‍රාමිකයාගේ නම

II. විශ්‍රාම ගැන්වීමට පෙර අයත්ව සිටි සේවය, දැරූ තනතුර/ ශ්‍රේණිය

III. නැවත සේවයේ යෙද වූ තනතුර/ ශ්‍රේණිය, තනතුර අයත් සේවය

IV. විශ්‍රාම වැටුප් අංකය

V. නැවත සේවයේ යෙදවීම අනුමතිය ලද ලිපි යොමුව

VI. නැවත සේවයේ යෙදවීමට අනුමතිය ලද කාලසීමාව

03. කොන්ත්‍රාත් පදනම මත පත්කිරීමේ දී මෙන්ම කොන්ත්‍රාත් පදනම මත පත් කළ විශ්‍රාමික නිලධරයකුගේ කොන්ත්‍රාත් පත්වීමක් දීර්ඝ කිරීමේ දී ද ඉහත 02 ඡේදය පරිදි තොරතුරු ලබා දිය යුතු ය.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ හා
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය